210135
2015.5.11
රු. 5000.00

# මජ්ඣිමනිකායෙහි සන්නිවේදන මාධ්‍ය විවිධත්වය පිළිබඳ අධ්‍යයනයක්

තුංකම පඤ්ඤාලංකාර හිමි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනසූරි පරීක්ෂණය සඳහා පාලි විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය යි.

Acc. No.
Call. No.
Library - USJP
210135
210135

LB/BC/DON/65/2015

LIBRARY
VERI...CATION

CR
லங்கா
கொழும்பு

..C..No. CR210135

Call. No. 294.3823072 PAN

## ශිෂ්‍යයාගේ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය, අභ්‍යන්තර පර්යේෂණ උපදේශක, මහාචාර්ය, පූජ්‍යපාද මාගම්මන පඤ්ඤානන්ද හිමිපාණන් වහන්සේගේ හා බාහිර පර්යේෂණ උපදේශක, සේවාර්ජිත මහාචාර්ය ඔලිවර් අබේනායක මැතිතුමාගේ සදුපදේශයෙන් ද පුස්තකාල අධ්‍යයනය තුළින් දත්ත රැස් කිරීමෙන් ද මා විසින් ස්වෝත්සාහයෙන් ම කරනු ලැබුවකි. මෙය, මෙම විශ්වවිද්‍යාලයේ ම හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ වෙනත් අධ්‍යාපන ආයතනයකට හෝ ඉදිරිපත් කළ නිබන්ධයක් හෝ නිබන්ධයක කොටසක් හෝ නො වන බවත් සහතික කරමි.

මෙයට,

පර්යේෂක,

තුංකම පඤ්ඤාලංකාර හිමි

GS/PhD/PALI/1307HU2010001

## උපදේශකවරුන්ගේ අනුමැතිය

වාචික පරීක්ෂණයේදී පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශිත සියලු නිවැරදි කිරීම්, සංශෝධන සහ එකතු කිරීම්, උපාධි අපේක්ෂකයා විසින් අවසාන නිබන්ධය සඳහා ඇතුළත් කර ඇති බව මෙයින් සහතික කරමි.

1. අභ්‍යන්තර පර්යේෂණ උපදේශක :

..................................................................

මහාචාර්ය පූජ්‍ය මාගම්මන පඤ්ඤානන්ද හිමි.

මහාචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමි
අධ්‍යයනාංශ ප්‍රධාන
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.

2. බාහිර පර්යේෂණ උපදේශක :

..................................................................

සේවාර්ජිත මහාචාර්ය ඔලිවර් අබේනායක

# පිදුම

මා දිවියේ

ජීවනාලෝකය

සැදූ සදාදරණීය

මව්නි, පියාණනි,

ඥානාලෝකය

පැදූ ගෞරවණීය

ගුරුදේවෝත්තම

නාහිමියනි මේ

නැණ මල් කළඹ

ඔබ හදවත්

සනහා ලන

සුවඳ පොදක් වේවා !

# කෙටි යෙදුම්

| | |
|---|---|
| අං නි | - අංගුත්තරනිකාය |
| ථෙර පා | - ථෙරගාථාපාළි |
| දී නි | - දීඝනිකාය |
| ම නි | - මජ්ඣිමනිකාය |
| ම නි අ සිං | - මජ්ඣිමනිකායට්ඨ කථා (සිංහල පරිවර්තනය) |
| ස පා | - සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා |
| සං නි | - සංයුත්තනිකාය |
| සිං ම නි | - සිංහල මජ්ඣිමනිකාය |

# පටුන

උපකාරානුස්මෘති iii-v

සාර සංක්‍ෂෙපය vi-vii

**පළමු පරිච්ඡේදය**

1. මූලාශ්‍රය අධ්‍යයනය 1-3

1.1 අර්ථ විවරණ 4-13

1.2 අන්තර්ගතය 13-24

1.3 සමවිසමතාව 25-27

1.4 සූත්‍ර දේශනා සඳහා පාදක වූ විවිධ පුද්ගලයන් හා ස්ථාන 28-46

**දෙවන පරිච්ඡේදය**

2. භාෂාව හා සන්නිවේදනය 47-49

2.1. භාෂා ව්‍යවහාරය පිළිබඳ ප්‍රාග් බෞද්ධ අදහස් 49-69

2.2. භාෂා ව්‍යවහාරය පිළිබඳ බෞද්ධ මතය 69-96

**තෙවන පරිච්ඡේදය**

3. මජ්ඣිමනිකායෙහි සන්නිවේදන මාධ්‍ය 97-104

3.1. සුවිශේෂී භාෂා ප්‍රයෝග 105-160

3.2. ගද්‍ය භාෂාව 160-168

3.3. පද්‍ය භාෂාව 168-179

**සිව්වන පරිච්ඡේදය**

4. මජ්ඣිමනිකායෙහි පද්‍ය ව්‍යවහාරය 180-185

4.1. පද්‍යවල ස්වරූපය 185-187

4.1.i. වාර්තාමය ස්වරූපය 187-191

4.1.ii. කාව්‍යමය ස්වරූපය 191-197

4.2. ඡන්දස් භාවිතය 197-201

4.3. අලංකාර භාවිතය 202-219

**පස්වන පරිච්ඡේදය**

5. මජ්ඣිමනිකායෙහි ගද්‍ය ව්‍යවහාරය 220-221

5.1. ගද්‍යවල ස්වරූපය 221-222

5.1.i. වාර්තාමය ස්වරූපය 223-230

5.1.ii. ගීතමය ස්වරූපය 230-234

5.2. අභිධර්ම ශෛලිය 234-236

5.3. ආඛ්‍යාන ශෛලිය 237-239

5.4. අලංකාර භාවිතය 239-260

**හයවැනි පරිච්ඡේදය**

6. සත්‍යාවබෝධය හා සන්නිවේදන මාධ්‍ය 261-274

6.1. සතරාකාර ධර්ම දේශනා විලාසය 274-286

6.2. උපමා කථා භාවිතය 286-306

නිගමනය 307-310

ආශ්‍රිත ග්‍රන්ථ 311-314

උපග්‍රන්ථය i-ii

## උපකාරානුස්මෘති

ජීවිතයේ මෙවන් සොඳුරු මොහොතක තුටු කඳුලින් නෙතු පුරවා ගන්නා ආදරණීය දෙමව්පියනි, සොයුරු සොයුරියනි, මාගේ අභිමතය පරිදි සසුන්ගත වීමට වරම් දී ඔබ කළ ඒ මහා පරිත්‍යාගය පළමුව හදවතින් සිහිපත් කරමි. දෙවනුව අපවත් වී වදාළ, මාගේ ගුරුදේවෝත්තම, ගෞරවණීය තුංකම පඤ්ඤාවංස නායක මාහිමිපාණන් වහන්සේට මෙය පූජෝපහාරයක් ලෙස පුදමින් සිහිපත් කරමි. ජීවමානව වැඩසිටියා නම් මේ මොහොතේ මටත් වඩා තුටු වන්නේ උන්වහන්සේ බව මම හොඳාකාර ව ම දනිමි. එහෙයින් උන්වහන්සේ පෙන්නූ මග ගමන් කිරීම ම උන්වහන්සේට සිදු කරන ගෞරවයක් කොට සලකමි. එසේ ම නාහිමියන් අපවත් වූ දා පටන් අපගේ අධ්‍යාපන කටයුතු නොකඩවා සිදු කර ගැනීමට මහා ශක්තියක් වූයේ පැවිදි සහෝදර, මාතර මහා මන්තින්ද පිරිවෙණේ ආචාර්ය, පූජ්‍ය තුංකම පඤ්ඤාසේන නාහිමියන් ය. උන්වහන්සේ නොසිටින්නට මෙතරම් දිගු ගමනක් කරා නිදහසේ පියමනින්නට කිසිදාක වරම් නොලැබෙනු ඇත. එසේ ම මා පැවිදි සහෝදර තුංකම පඤ්ඤාකිත්ති හිමියන්, හිගුරේ පඤ්ඤාසේකර හිමියන්, ඇත්බටුවේ පඤ්ඤාසාගර හිමියන්, කොටවායේ සාගර හිමියන්, ඇත්බටුවේ රතන හිමියන්, එළමල්දෙණියේ ආනන්දසාගර හිමියන්, තුංකම පඤ්ඤාසීහ හිමියන්, තිස්සමහාරාමයේ පඤ්ඤාතිලක හිමියන් මෙන් ම අනෙක් සොයුරු හිමිවරුන් ද ගෞරවයෙන් සිහිපත් කරමි.

මා පිරිවෙන් අධ්‍යාපනයට අත්පොත් තැබුවේ මාතර සිරි වජිරඥාන ධර්මායතනයේ දී ය. රහට පාලි පද කියා දී අකුරට හුරු කළ පූජනීය පැළෑණේ සුවිනීත හිමිපාණන් කෘතවේදී ව සිහිපත් කරමි. එයින් පසු අධ්‍යාපන කටුයතු සඳහා අහඹු ලෙස සම්බන්ධ වූ මහරගම ශ්‍රී ප්‍රඥානන්ද මහ පිරිවෙණ කිසිදාක අමතක කළ නොහැකි ආයතනයකි. අපගේ ගුරුදේවෝත්තම නාහිමිපාණන්ට සම සෙනෙහසින් යුත් ගෞරවණීය අමරපුර සිරි ධර්මරක්ෂිත මහනිකායේ අනුනායක, ශාස්ත්‍රපති, පණ්ඩිත, වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේට මා මෙතුවක් පැමිණි ගමනේ දී සදා ණය ගැති වෙමි. පිරිවෙණෙහි උසස් අධ්‍යාපනය හදාරන විට උන්වහන්සේ මෙන් ම ගෞරවණීය දර්ශනපති, වටගෙදර විමලසාර හිමියන් ප්‍රමුඛ කිතලගම විනයාලංකාර හිමියන්, කිතලගම පඤ්ඤාජීව හිමියන්, කේ. එච්. ජේ. අමරසේන මහත්මා,

පාලිත මහත්මා, වසන්ත මහත්මා හා චමින්ද උපුල් මහත්මා ඇතුළු ආචාර්ය මණ්ඩලය නොමසුරුව ඥානාලෝකය ලබාදුන් හෙයින් නුදුරෙහි පිහිටි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පියමනින්නට වරම් ලැබුණි. මෙහි දී කථිකාචාර්ය මඩිහේ සුගතසිරි හිමියන් හා කෝට්ටේ ඥානාරාම හිමියන් ද එසේ ම අත්තුඩාවේ විමලතිස්ස හිමියන් හා වෙලේගොඩ උපවංස හිමියන් ද කෘතවේදී ව සිහිපත් කරමි.

විද්‍යාර්ථීන්ට නැණ පවස නිවාලන තෝතැන්නක් බඳු මහරගම ශ්‍රී ප්‍රඥානන්ද මහ පිරිවෙණට පැමිණි දා පටන් මේ දක්වා ලෙන්ගතු ව කටයුතු කරන වැල්ලේතොට ඉන්දානන්ද හිමියන්, උලහිටියාවේ විභාවි හිමියන්, කටුවන පියරතන හිමියන්, සූරියවැවේ විජිතනන්ද හිමියන්, විජේපුර ගුණානන්ද හිමියන්, කිතලගම නන්දසාර හිමියන්, ඒරුවැවේ ගුණසෝම හිමියන්, මලිදූවේ සුජාත හිමියන්, උණාවටුනේ රාහුලතිලක හිමියන්, මනම්පිටියේ සාරදතිලක හිමියන් හා මනම්පිටියේ සද්ධාතිලක හිමියන් ඇතුළු සියලු හිමිවරුන් හා දිනේෂ් මහතා, ගුණතිලක මහතා හා සුරංග මහතා සහෝදරත්වයෙන් යුතු ව මෙතුවක් ලබාදුන් සහයෝගය අගය කරමි.

සරසවි වරම් හිමි වූ දා පටන් ලද නිසි අධ්‍යාපනය හේතුවෙන් මෙවන් උසස් අවස්ථාවක් කරා එළඹෙන්නට මග විවර විය. එහෙයින් සරසවි දිවියේ අධ්‍යාපනය කටයුතු සාරවත් ව කර ගැනීමට මග පෑදූ, මහාචාර්ය පූජ්‍ය මාගම්මන පඤ්ඤානන්ද හිමියන්, සේවාර්ජිත මහාචාර්ය, ඔලිවර් අබේනායක මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දුනේශ් ඉඳුරත්න ගුණතිලක මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගාමිණී රත්න ශ්‍රී මහතා, කථිකාචාර්ය අරුණ කේ. ගමගේ මහතා, මහාචාර්ය, නායිම්බල ධම්මදස්සි හිමියන්, මහාචාර්ය, වෝල්ටර් මාරසිංහ මහතා, මහාචාර්ය, ආරියපාල පෙරේරා මහතා, මහාචාර්ය, චන්ද්‍රාවික්‍රමගමගේ මහත්මා, මහාචාර්ය, සමන් චන්ද්‍ර රණසිංහ මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වීරසේන මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කුඹුකේ චන්දාලෝක හිමියන්, කථිකාචාර්ය, කත්තෝරුවේ විනීත හිමියන් හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වසන්ත මෙන්ඩිස් මහතා ඇතුළු සියලු ආචාර්ය මණ්ඩලය ද කෘතවේදී ව සිහිපත් කරමි.

විශේෂයෙන් පශ්චාද් උපාධි ආයතනය සම්බන්ධ ව මෙම දර්ශනසූරි උපාධි පරීක්ෂණය සිදුකිරීමේ දී සදුපදේශ සැපයූ මහාචාර්ය, පූජ්‍ය මාගම්මන පඤ්ඤානන්ද හිමියන්ට ද, සේවාර්ජිත මහාචාර්ය ඔලිවර් අබේනායක ගුරුතුමන්ට ද ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මැදගම්පිටියේ විජිතධම්ම හිමියන්ට ද කෘතඥතා පූර්වක පුණ්‍යානුමෝදනාව සිදු කරමි. එසේ ම මෙම පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිතුමිය හා ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ද ස්තුති පූර්වක ව පුණ්‍යානුමෝදනාව සිදුකරමි.

විශ්වවිද්‍යාලයේ දී මෙන් ම ඉන් අනතුරුවත් අධ්‍යාපන කටයුතු කරගෙන යෑමේ දී බොහෝ උපකාරී ව සබැඳි කථිකාචාර්ය නෙල්ලිවල මෙත්තානන්ද හිමියන්, කථිකාචාර්ය විතාරන්දෙණියේ චන්දසිරි හිමියන්, කථිකාචාර්ය පණහඩුවේ යසස්සි හිමියන්, බඳගිරියේ සිරිනන්ද හිමියන්, නේපාලයේ වජිර හිමියන්, කථිකාචාර්ය ධම්මසිරි හිමියන්, ටෙරන්ස් මහතා, සුජීවා මහත්මිය, නිලුක්ෂි මහත්මිය, හසිනි සොහොයුරිය හා නිලානි සොහොයුරි ද කෘතවේදී ව සිහිපත් කරමි.

එසේ ම දැනට මා සේවය කරන මහරගම ශ්‍රී ප්‍රඥානන්ද මහ පිරිවෙණෙහි ගරු පරිවේණාධිපති, ශාස්ත්‍රපති, මඩුපොත සරණතිස්ස හිමියන්, නියෝජ්‍ය පරිවේණාධිපති වැල්ලවත්තේ රතනවංස හිමියන්, ආචාර්ය ගොඩාමුනේ චුල්ලනාග හිමියන්, වෑගම ඛේමසාර හිමියන් ද මේ සඳහා පරිවර්තන කටයුතු ආදියෙන් සහාය වූ චමින්ද උපුල් මහතා ද සමන්ත මහතා හා අමිල නුවන් සමරසිංහ මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලය ලබාදුන් සහයෝගය පුණ්‍යානුමෝදනාත්මක ව සිහිපත් කරමි.

තවදුරටත් මෙහි පිටු සැකසුම නිසි පරිදි සිදු කර දුන් ලලිත් ටයිප්සෙටින් ආයතනයටත්, චමිමික පොත් බඳින්නන්හටත් බෙහෙවින් ම ස්තුතිවන්ත වෙමි. අවසාන වශයෙන් මාගේ නිබන්ධය මැනවින් සිදු කර ගැනීම සඳහා නන් අයුරින් මග පෙන් වූ උපකාරී වූ සැමට හෘදයාංගම ස්තුතිය හා පුණ්‍යානුමෝදනාව සිදු කර සිටිමි. තෙරුවන් සරණයි.

**මජ්ඣිමනිකායෙහි සන්නිවේදන මාධ්‍ය විවිධත්වය**

**පිළිබඳ අධ්‍යයනයක්**

**තුංකම පඤ්ඤාලංකාර හිමි**


**සාර සංක්ෂෙපය**

සූත්‍රපිටකයට අයත් මජ්ඣිමනිකාය සුවිශේෂී සූත්‍ර එකතුවකි. අටුවාචාරීන්ගේ මතයට අනුව පරවාද මථනය කිරීමටත්, යථාර්ථවාදී දර්ශනය හෙළි කිරීමටත් දේශිත සූත්‍ර ගොනුවකි. බුද්ධ භාෂිත හා ශ්‍රාවක භාෂිත මිශ්‍ර ව පවත්නා මෙහි හර පද්ධතිය ඉතා ඉහළ ය. එහෙයින් මෙමගින් බෞද්ධ දර්ශනයෙහි විවිධ පැතිකඩ ඔස්සේ අවධානය යොමු ව ඇත. එහෙත් මෙම සූත්‍ර පාදක කර ගනිමින් සන්නිවේදනය සම්බන්ධ ව කරන ලද පර්යේෂණ විරල ය.

එම නිසා මෙහි දී මජ්ඣිමනිකායෙහි සූත්‍රානුසාරයෙන් එහි සන්නිවේදන මාධ්‍ය විවිධත්වය පිළිබඳ අධ්‍යයනය කිරීම අපගේ අවශ්‍යතාව විය. ඒ සඳහා ඉදිරිපත් කළ මාතෘකාව 'මජ්ඣිමනිකායෙහි සන්නිවේදන මාධ්‍ය විවිධත්වය පිළිබඳ අධ්‍යයනයක්' යන්න ය. මෙහි දී 'සන්නිවේදන මාධ්‍ය' ලෙස අප අදහස් කළේ භාෂාව නොව භාෂා භාවිතය හෙවත් ව්‍යවහාර විධීන් පිළිබඳ පර්යේෂණය කිරීම ය.

ඒ අනුව මජ්ඣිමනිකායෙහි සන්නිවේදන මාධ්‍ය හෙවත් භාෂා ව්‍යවහාර විවිධත්වය පිළිබඳව සිදු කරන ලද මෙම නිබන්ධයෙහි පරිච්ඡේද පෙළ ගැස්ම මෙසේ ය.

- මූලාශ්‍රය අධ්‍යයනය
- භාෂාව හා සන්නිවේදනය
- මජ්ඣිමනිකායෙහි සන්නිවේදන මාධ්‍ය
- මජ්ඣිමනිකායෙහි පද්‍ය භාෂාව
- මජ්ඣිමනිකායෙහි ගද්‍ය භාෂාව
- සත්‍යාවබෝධය හා සන්නිවේදන මාධ්‍ය

ධර්ම සන්නිවේදනයෙහි ලා බුද්ධචරිතයෙන් විදහා දක්වෙන ලක්ෂණ අතර විශේෂ අවස්ථා තුනකි. එනම්, උතුම් රූප ශ්‍රීය, මධුර ස්වරය හා විවිධ දේශනා විලාසය යි. ඒ අතරින් මෙම පර්යේෂණයට පාදක වන දේශනා විලාසය සඳහා මහෝපකාරී වූ අංගයක් ලෙස සුවිශේෂී භාෂා ප්‍රයෝග භාවිතය දක්විය හැකිය. ඒ අතර උපමා භාවිතය ද සුවිශේෂී වූවකි. ඒ අනුව ඉහත සඳහන් පරිච්ඡේදයන්ට අනුගත ව සුවිශේෂී භාෂා ප්‍රයෝගයන්ගෙන් සමන්විත විවිධ වූ දේශනා විලාසයන් ප්‍රස්තුත කර ගනිමින්, මෙතෙක් හමු නො වූ විශේෂ කරුණු උද්දීපනය කරලීම මෙම පරීක්ෂණයේ අපේක්ෂාව විය.

# පළමු පරිච්ඡේදය

## 01 මූලාශ්‍රය අධ්‍යයනය

ත්‍රිපිටකයේ සූත්‍රපිටකයට අයත් නිකාය පස අතරින් මෙහි දී අවධානය යොමු වන්නේ මජ්ඣිමනිකාය වෙතට යි. **'අටුවාචාරීන්ගේ විග්‍රහය අනුව මජ්ඣිමනිකාය වූ කලී ශාස්වත අශාස්වතාදී වශයෙන් දැක්වෙන අනේකවිධ වූ පරවාද මර්ථනය කරන්නට සමත් වූ ද, එනයින් යථාර්ථ දර්ශනය පිණිස මග හෙළි කරන්නා වූ ද සූත්‍ර සංග්‍රහය යි. 'මහාවිපස්සනා' යන අපර නාමයකිනුදු සම්භාවිත එය *පණ්ණාසක* හෙවත් සූත්‍ර පනස බැගින් වූ කාණ්ඩ තුනෙකින් සමන්විත ය.'**[1] ඉන් එක් කොටසකට වග්ග පහ බැගින් වර්ග පසළොසකින් ද සමන්විත වේ. එසේ ම මධ්‍යම ප්‍රමාණයේ සූත්‍ර සමූහයකින් යුක්ත වන නිසා *'මජ්ඣිම'* නාමයෙන් මෙම නිකාය හඳුන්වා ඇත. 'දීඝනිකායෙහි මෙන් සංස්කෘතික හා සාමාජික තොරතුරු සවිස්තර ව නොතිබීමත්, ධර්ම කරුණු අධික වීමත් මජ්ඣිමනිකායෙහි විශේෂ ලක්‍ෂණයකි. තව ද සංයුත්ත හා අංගුත්තරනිකායවල මෙන් ධර්ම කරුණු ඉතා සංක්‍ෂිප්ත ව ධර්ම ලේඛන ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමක් ද මෙහි දක්නට නොමැත. **ඒ ඒ ධර්ම කරුණු ඉතා දීර්ඝවත් ඉතා කෙටියෙනුත් නොව ප්‍රමාණවත් අන්දමින් මෙහි විවරණය වී ඇත.'**[2]

'පශ්චාත් ත්‍රිපිටක යුගයේ ශෛලීගත අයුරින් සංස්ථාගත වී ඇති බෞද්ධ භාවනා ක්‍රමයේ ආරම්භක ස්වරූපය හඳුනා ගැනීම සඳහා මෙම සූත්‍රවලින් ලැබෙන ආලෝකය ඉමහත් ය.'[3] ධම්මපද, සුත්තනිපාත, ථෙරගාථා, ථෙරීගාථා ආදී කෘති සමූහයක් පද්‍යයෙන් සකස් වී ඇති අතර ඒවා එක්තරා රිද්මයකට සජ්ඣායනා කළ හැකිය. එබැවින් සූත්‍ර දේශනාවල අර්ථ රසය මෙන් ම ශබ්ද රසය ද අනූනව පවතින බව කිව යුතුය. මජ්ඣිමනිකායාගත සූත්‍ර දේශනාවලින් සමහරක් ද මෙසේ අර්ථ රසය හා ශබ්ද රසය පිළිබඳ මනා සංකලනයෙන් සකස් වූ රචනාවක් ලෙස ඇගයීමට ලක් කළ හැකිය.'[4]

---

1. මේධානන්ද හිමි, දේවාලේගම, ඔපම්ම වග්ගයේ එන දහම් කරුණු පිළිබඳ කෙටි විවරණයක්,' ප්‍රඥා ශාස්ත්‍රීය සංග්‍රහය, විද්‍යාලංකාර මහා ශිෂ්‍ය සංගමය, පැලියගොඩ, 2008, 106 පිට.
2. **සිං. ම. නි.** 1, xii පිට.
3. එම, xiii පිට.
4. එම, xx පිට.

ඉහත කරුණු අනුව **මජ්ඣිමනිකායෙහි** සූත්‍ර දේශනාවන් පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී විවිධ වූ විශේෂ කාරණාවන් ඉස්මතු වේ. අප මෙහි දී අවධානය යොමු කරන්නේ බෞද්ධයාගේ පරම නිෂ්ඨාව වන නිර්වාණය කරා ශ්‍රාවකයා යොමු කරවීමට අවශ්‍ය ධර්මෝපදේශයන් ලබාදීම සඳහා උපයෝගි කරගත් සන්නිවේදන මාධ්‍යය විවිධත්වය පිළිබඳ විමර්ශනය කිරීමට ය. 'සන්නිවේදකයාණවරයකු වශයෙන් බුදුරජාණන් වහන්සේ විෂයෙහි පැවති ග්‍රාහකයන්ගේ පැහැදීම ඇති කරවන විශේෂ ලක්ෂණ කිහිපයක් ගැන **අංගුත්තරනිකායේ** සඳහන් වේ. ඒ අනුව ඇතැම්හු උන්වහන්සේගේ දෙතිස් ලකුණින් හා අසූවක් අනුව්‍යඤ්ජනයන්ගෙන් පරිමිත රූපකාය කෙරෙහි ප්‍රසාදයෙන් යුක්ත ව ධර්ම දේශනයට සවන් යොමු කරති. ඇතමෙක් උන්වහන්සේගේ මධුර ස්වරය කෙරෙහි පැහැදීමෙන් යුක්ත ව උන්වහන්සේගේ ධර්ම දේශනයට සවන් යොමු කරති. මුල, මැද, අග යහපත් වූ ධර්මය කෙරෙහි පැහැදෙන ඇතැම්හු සවන්පත් විදහා උන්වහන්සේගේ මධුර ස්වරය කෙරෙහි පැහැදීමෙන් යුක්ත ව එම ධර්ම දේශනයට සවන් යොමු කරති.'[5] බුදුරජාණන් වහන්සේගේ

**රූපශ්‍රීය,**

**මධුර ස්වරය,**

**විවිධ දේශනා විලාසය,**

ධර්ම සන්නිවේදනය සඵල කරගැනීම සඳහා බෙහෙවින් බලපෑ අයුරු මේ අනුව මැනවින් පැහැදිලි වේ. එහෙයින් මජ්ඣිමනිකායාගත සූත්‍ර ධර්ම තුළින් ද විවිධ වූ කාරණාවන් ඉස්මතු වී පෙනෙන්නේ එහි සන්නිවේදන මාධ්‍යයෙහි ඇති විවිධත්වය නිසා ම ය. කල්ප කාලාන්තරයක් පෙරුම්දම් පුරා ඉතා අපහසුවෙන් අවබෝධ කරගත් ධර්මය විවිධ වූ හැඟීම්වලින් ගහන වූ මිනිසුන්ට පැහැදිලි කරදීම එතරම් පහසු කාර්යයක් නොවේ. 'මෙම අභියෝග ජය ගැනීම සඳහා බුදු හිමියන් භාවිත කොට ඇත්තේ භාෂාව නමැති මෙවලම ය. භාෂාව වනාහි මනස ඇතුළු ඉන්ද්‍රියයන් අත්දකිනු ලබන දේ අදහස් මගින් ප්‍රකාශනයට පත්කිරීම සඳහා භාවිත කරනු ලබන සංකේත සමූහයකි. එහෙත් එය යථාර්ථය අවබෝධ කරවීමට ඇති දුර්වල උපකරණයක් වන බැවින් ඇති වන විවිධ බාධක ජයගනිමින්, තමන් වහන්සේ අවබෝධ කරගත් ධර්මය ශ්‍රාවකයා වෙත සම්ප්‍රේෂණය කිරීම සඳහා බුදු හිමියන්ට ද එකී භාෂාව ම භාවිත කිරීමට සිදු

---

5. මහින්ද කරුණාදාස ලියනාරච්චි, 'බෞද්ධ සන්නිවේදන විධි සමග නූතන ජනසන්නිවේදන විධීන් පිළිබඳ විමසීමක්,' සම්භාෂා, 12 වැනි කලාපය, 2002, අධ්‍යාපන අමාත්‍යංශයේ පිරිවෙන් ඒකකය, බත්තරමුල්ල, 849, 850 පිටු.